අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50
+94112785818
info@moe.gov.lk
www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/01/වා.ස්.මා - 2024

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.06. 20

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරු,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරු,

**<u>ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම - 2024</u>**

මාගේ සමාංක හා 2024.05.23 දිනැති ලිපිය හා ඒ සමඟ ඉදිරිපත් කළ 2024 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල යෝජනා හා බැදේ.

02. එම ස්ථාන මාරු මණ්ඩල යෝජනා සඳහා අභියාචනා කැඳවීම අනුව මා වෙත ඉදිරිපත් වූ අභියාචනා පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ජේදයේ 254 සහ 255 වගන්ති අනුව වූ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ මේ සමඟ ඉදිරිපත් කරමි. මෙමඟින් සිදු කරනු ලැබූ සංශෝධනයන්ට යටත්ව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2024.05.23 දිනැති ලිපිය මඟින් යෝජිත 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් අනුමත කරමි. **එම නියෝග අධ්‍යාපන අමාත්‍යාංශයේ http:/www/moe.gov.lk වෙබ් අඩවියේ පළකර ඇත.**

03. ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් වන අභියාචනා :

(අ) ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධරයන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති XX වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැක. **තම අභියාචනය 2024.06.26 දිනට පෙර ඉදිරිපත් කළ යුතු අතර එදිනට පසුව ඉදිරිපත් කරන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

(ආ) සමාලෝචන කමිටුවට අභියාචනා ඉදිරිපත් කළ නිලධරයන්ට පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ ලිපියේ පිටපතක් තම විද්‍යාලයේ විදුහල්පතිවරයා මඟින් මා වෙත එවිය යුතුය. ඒ සමඟම අභියාචනයෙහි සඳහන් කරුණු සනාථ කිරීමට අදාළ ලේඛන අමුණා එවිය යුතුය.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම

**(අ) 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග උක්ත සමාලෝචන කමිටු තීරණ යටතේ 2024.07.22 දින සිට ක්‍රියාත්මක විය යුතුය.**

(ආ) ඒ අනුව ඔබ විද්‍යාලයේ සේවය කරන ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධරයන් නියමිත දිනයේ නව සේවා ස්ථානයන්හි රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන මුදා හැරීමට ක්‍රියා කරන ලෙස දන්වා සිටිමි.

05. ඉහත 04(ආ) අනුව කටයුතු කිරීමෙන් පසු යම් නිලධරයෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති 257- V වගන්තිය අනුව සේවය හැරයෑමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

06. 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව නව සේවා ස්ථානයට වාර්තා කරන නිලධාරීන් මේ සමඟ ඇමුණුම් ලෙස ඉදිරිපත් කර ඇති ආකෘති පත්‍ර 01 මඟින් ස්ථාන මාරු ක්‍රියාත්මක වන දින සිට සති 2ක් ඇතුළත එනම් 2024.08.05 දිනට පෙර මා වෙත වාර්තා කළ යුතුය.

07. මෙම වාර්ෂික ස්ථානමාරු හේතුවෙන් ප්‍රවාහන අපහසුතා හෝ වෙනත් යම් කරුණක් පදනම් කරගෙන ස්ථානමාරු වීමට අකමැති නිලධාරීන් සිටිනම් ඔවුන් පළාත් පාසල් සඳහා නිදහස් කිරීම කළහැකි බව කාරුණිකව දන්වමි.

ජේ.එම්.තිලකා ජයසුන්දර
ලේකම්